# සමාජවිද්‍යාව
# (Sociology)
# (SOCI)

## ශාස්ත්‍රවේදී සාමාන්‍ය උපාධි (බාහිර) පාඨමාලාව

# විෂය නිර්දේශය

දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය
කැලණිය විශ්වවිද්‍යාලය
කැලණිය

www.cdce.kln.ac.lk

**නව විෂය නිර්දේශය**

ප්‍රථම මුද්‍රණය - 2022

මෙම විෂය නිර්දේශයන්හි අන්තර්ගත කරුණු අදාළ අධ්‍යයන අංශයන්ට හිමි වන අතර මෙහි ප්‍රකාශන අයිතිය දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය සතු වේ.

දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රයෙන් ලිඛිත අවසරයකින් තොරව මෙහි සඳහන් කරුණු උපුටා දැක්වීම මුද්‍රණය කිරීම සපුරා තහනම් වේ.

**ප්‍රකාශනය :**

*දූරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය*

*කැලණිය විශ්වවිද්‍යාලය*

*කැලණිය*

# සමාජවිද්‍යාව

| ස්තරය | සමාසිකය | පාඨමාලා කේතය | පාඨමාලා ඒකකයේ නම | අනිවාර්ය/ වෛකල්පික | අධ්‍යයන සම්භාර |
|---|---|---|---|---|---|
| 01 | I සහ II | SOCI 18214 | සමාජවිද්‍යාවේ මූලික සංකල්ප | අනිවාර්ය | 4 |
| | | SOCI 18224 | ප්‍රායෝගික සමාජවිද්‍යාව | අනිවාර්ය | 4 |
| 02 | III සහ IV | SOCI 28214 | සමාජවිද්‍යාත්මක න්‍යාය | අනිවාර්ය | 4 |
| | | SOCI 28224 | සංස්කෘතිය සහ සංවර්ධනය | අනිවාර්ය | 4 |
| 03 | V සහ VI | SOCI 38214 | දකුණු ආසියාතික සමාජය | අනිවාර්ය | 4 |
| | | SOCI 38224 | සමාජ පර්යේෂණ ක්‍රම | අනිවාර්ය | 4 |

# ප්‍රථම වසර

# SOCI 18214
# SOCI 18224

**පාඨමාලා කේතය** :- **SOCI 18214**

**වර්ගය** :- හර

**මාතෘකාව** :- සමාජවිද්‍යාවේ මූලික සංකල්ප

**ඉගෙනුම් පල** :-

මෙම විෂය ඒකකය හැදෑරීම තුළින් ශිෂ්‍යයන් තුළ සමාජවිද්‍යාවේ සම්භාව්‍ය සමාජ විද්‍යාඥයන් හා නූතන සමාජ විද්‍යාඥයන්ට අනුව සමාජවිද්‍යාව නිර්වචනය කිරීම, සමාජවිද්‍යාව ස්වාධීන විෂය ශික්ෂණයක් ලෙස සංවර්ධනය කිරීමට දායක වූ පුරෝගාමී සම්භාව්‍ය සමාජ විද්‍යාඥයන් හඳුනා ගැනීම, සමාජවිද්‍යාත්මක සංකල්ප හා මූලික න්‍යායාත්මක විශ්ලේෂණ පිළිබඳ අවබෝධ කර ගැනීම, මූලික සමාජවිද්‍යාත්මක සංකල්ප හා න්‍යායාත්මක විග්‍රහයන් ඔස්සේ සමාජය යනු කුමක් දැ යි විග්‍රහ කිරීම, සමාජ ව්‍යූහය සහ සංවිධානය හා එහි පැවැත්ම විග්‍රහ කිරීමට අවබෝධය වර්ධනය කිරීම අපේක්ෂිත ය.

**පාඨමාලා අන්තර්ගතය** :-

**1. සමාජවිද්‍යාවේ ආරම්භය ඓතිහාසික පසුබිම හා සංවර්ධනය:**

- බටහිර යුරෝපීය බුද්ධි ප්‍රබෝධය: විද්‍යාවේ පුනරුදය, ප්‍රංශ මහා විප්ලවය හා දේශපාලන ප්‍රතිසංස්කරණ, කාර්මික විප්ලවය හා ධනවාදයේ නැගීම, සමාජවාදයේ නැගීම, නාගරීකරණය, ආගමික පුනරුදය සහ ස්ත්‍රීවාදී ව්‍යාපාරවල මූලාරම්භය.
- පළමුවන සහ දෙවන ලෝක යුද්ධවල බලපෑම.

- සමාජවිද්‍යාව විෂයක්ෂේත්‍රයේ සංවර්ධනය.
- සමාජවිද්‍යාවේ මූලාරම්භක යුගය: සෙන්ට් සිමෝන්, ඔගස්ට් කොම්ට්, හැරියෙට් මාටින්‍යු, හර්බට් ස්පෙන්සර්, සහ එමිල් ඩුර්කයිම්.

## 2. සමාජවිද්‍යාව හා අනෙකුත් සමාජීය විද්‍යාවන් අතර ඇති සම්බන්ධතාව:

- ස්වභාවික විද්‍යා සහ සමාජීය විද්‍යා.
- සමාජවිද්‍යාව හා අනෙකුත් සමාජීය විද්‍යා.
- සමාජවිද්‍යාව හා සමාජ මානවවිද්‍යාව අතර ඇති සම්බන්ධතාව.
- සෙසු සමාජීය විද්‍යාවන් අතර සමාජවිද්‍යාවේ සුවිශේෂත්වය.
- සමාජය පිළිබඳ විද්‍යාවක් තිබිය හැකි ද?

3. **සමාජය:**

- සමාජය යනු කුමක් ද?
- පුද්ගලාන්තරක්‍රියා, සමූහ අන්තර්ක්‍රියා සහ සංස්ථාගත අන්තර්ක්‍රියා.
- සමාජ ව්‍යූහය සහ සංවිධානය.
- සමාජ තත්ත්වයන් සහ කාර්ය කොටස්: කාර්ය කොටස් ගැටුම හා ගැටුම් කළමනාකරණය කිරීම.
- සමාජ සමූහ සහ ඒවායේ ක්‍රියාකාරිත්වය.

## 4. සමාජවිද්‍යාත්මක පරිකල්පනය සහ සමාජ නවෝත්පාදනය:

- සමාජවිද්‍යාත්මක පරිකල්පනය සහ සමාජ සිද්ධි.
- නව සමාජීය සංකල්ප සහ සහසම්බන්ධතා සඳහා වූ උපායමාර්ග.

**5. සමාජානුයෝජනය:**

- සමාජානුයෝජනය සංකල්පය නිර්වචනය කිරීම.
- සමාජානුයෝජන ක්‍රියාවලියේ වැදගත්කම.
- සමාජානුයෝජන ක්‍රියාවලියේ ක්‍රියාකාරිත්වය; ප්‍රාථමික හා ද්විතීයික සමාජානුයෝජන කාරක.
- සමාජානුයෝජනයේ විවිධ මාදිලි.

**6. සමාජ සංස්ථා:**

- සමාජ සංස්ථා යනු කුමක් ද?
- ප්‍රධාන සමාජ සංස්ථා සහ ඒවායේ කාර්යභාරය: පවුල විවාහය සහ ඥාතීත්වය, අධ්‍යාපනය, නීතිය, ආර්ථිකය සහ දේශපාලන සංස්ථාව.
- සමාජ සංස්ථා සහ සමාජ ව්‍යුහයේ ක්‍රියාකාරිත්වය උදෙසා සංස්ථාවල කාර්යභාරය.

**7. සමාජ ස්තරායනය:**

- සමාජ ස්තරායනය පිළිබඳ මූලික හැඳින්වීම.
- සමාජ ස්තරායනය පිළිබඳ න්‍යායාත්මක හඳුනාගැනීම.
- කුලය, පංතිය, ලිංගිකත්වය සහ වාර්ගිකත්වය සමාජ ස්තරායනයේ ප්‍රධාන සාධක ලෙස හඳුනා ගැනීම.

**8. නිලබල ක්‍රමය:**

- නිලබල ක්‍රමයක අවශ්‍යතාව හඳුනාගැනීම.
- මැක්ස් වෙබර් හඳුන්වා දුන් නිලබල ක්‍රමය පිළිබඳ පරමාදර්ශී මූලිකාංග.
- නිලබල ක්‍රමය පිළිබඳ ව එල්ල වූ විවේචන.
- සංවිධානාත්මක චර්යාවේ නව ප්‍රවණතා.

**9. සමාජපාලන උපක්‍රම:**

- සමාජපාලනය යනු කුමක් ද?
- සමාජපාලනයේ නව ප්‍රවණතා.
- විධිමත් හා අවිධිමත් සමාජපාලන උපක්‍රම.

**ඉගෙනුම්/ඉගැන්වීම් ක්‍රමවේදය :-**

දේශන, මාර්ගගත දේශන, එල්.එම්.එස්. (LMS), සාකච්ඡා, ඉදිරිපත් කිරීම්, නිබන්ධන සහ පැවරුම් යනාදී විෂය ඉගැන්වීම් ක්‍රමවේද ප්‍රයෝජනයට ගනියි.

**ඇගයීමේ ක්‍රමය :-**

අධ්‍යයන වර්ෂය අවසානයේ ලිඛිත පරීක්ෂණය සඳහා ලකුණු 100% හෝ අධ්‍යයන වර්ෂය අවසානයේ දී ලිඛිත පරීක්ෂණය සඳහා ලකුණු 80% ක් සහ පැවැරුම් සඳහා ලකුණු 20% ක් හිමි වේ.

**නිර්දේශිත කියවීම් :-**


1. පෙරේරා, ටෙනිසන්, බී. ඒ. (1993) මානව හා සමාජ විද්‍යා ප්‍රවේශය. කොළඹ: ඇස් ගොඩගේ සහ සහෝදරයෝ.
2. කුමාර, හේමන්ත; (2015) සමාජ විද්‍යා ප්‍රවේශය. මාතර: රුහුණු අධ්‍යයන කවය.
3. සිල්වා, කාලිංග ටියුඩර්, (2005). කුලය, පන්තිය හා වෙනස් වන ලංකා සමාජය. බොරලැස්ගමුව( විසිදුණු ප්‍රකාශකයෝ)
4. Barnard, Andy and Burgess, Terry (1996). Sociology Explained, Cambridge: Cambridge University Press.
5. Billton, T, et al.: (1987). Introductory Sociology. London: Macmillan press Ltd.

6. Giddens, Anthony. (2014). Sociology (6th ed.). Cambridge, Polity Press.
7. Gupta, Dipankar. (1996). Social Stratification. New Delhi: Oxford University Press.
8. Jain Roshni. (2017). Sociology; An Introduction to Sociology. New Delhi: AITBS Publishers.
9. McIntyre, Lisa J. (2002). The Practical Skeptic: Core Concepts in Sociology. Boston: Mcgraw Hill Higher Education.
10. Rao, Shankar C.N. (2002). Sociology: Primary Principals. New Delhi: C. Chand Company.
11. Ritzer, George, (2000). Classical Sociological Theory. Boston: Mcgraw Hill Higher Education.

**පාඨමාලා කේතය** :- **SOCI 18224**

**වර්ගය** :- හර

**මාතෘකාව** :- ප්‍රායෝගික සමාජවිද්‍යාව

**ඉගෙනුම් පල** :-

මෙම විෂය ඒකකය හැදෑරීමෙන් පසුව ප්‍රායෝගික සමාජවිද්‍යාව යනු කුමක් දැ යි නිර්වචනය කිරීම හා එහි අවශ්‍යතාව තේරුම් ගැනීම, නූතන සමාජයේ මූලික සමාජ ක්‍රියාවලිය, වෙනස්වීම් සහ සමාජ ගැටලු හඳුනා ගැනීම, අදාළ සමාජවිද්‍යාත්මක සංකල්ප හා න්‍යායාත්මක මූලධර්ම ඔස්සේ ප්‍රධාන සමාජ ප්‍රශ්න විග්‍රහ කිරීම, හඳුනාගත් සමාජ ප්‍රශ්නවලට පිළියම් කිරීම සඳහා සුදුසු විසඳුම් සෙවීමට උත්සාහ කිරීම සහ මානව ක්‍රියාකාරිත්වයේ මැදිහත්වීම හේතුවෙන් සමාජය වෙනස්වන ආකාරය විග්‍රහ කිරීමේ හැකියාව සිසුන් තුළ වර්ධනය කිරීමට අපේක්ෂිත ය.

**පාඨමාලා අන්තර්ගතය :-**

ප්‍රායෝගික සමාජවිද්‍යාව, එහි මූලාරම්භය ඓතිහාසික පසුබිම හා කාර්යභාරය:

- ප්‍රායෝගික සමාජවිද්‍යාව හා න්‍යායාත්මක සමාජවිද්‍යාවේ වෙනස.
- ප්‍රායෝගික සමාජවිද්‍යාවේ විෂයක්ෂේත්‍රය.
- ප්‍රායෝගික සමාජවිද්‍යාඥයාගේ කාර්යභාරය.
- සමාජ පර්යේෂණ හා ප්‍රායෝගික සමාජවිද්‍යාව අතර ඇති සම්බන්ධතාව.

**2. සමාජ වෙනස්වීම:**

- සමාජ වෙනස්වීමේ සංකල්පය තේරුම් ගැනීම.
- සමාජ වෙනස්වීම සඳහා බලපාන සාධක: කෙටි කාලීන සමාජ වෙනස්වීම හා දිගු කාලීන සමාජ වෙනස්වීම සහ සමාජ සංචලතාව
- දිගු කාලීන සමාජ වෙනස්වීම: නවීකරණය, නාගරීකරණය, වාණිජකරණය, ගෝලීයකරණය සහ බටහිරකරණය යන සාධකවල ස්වභාවය හා බලපෑම.

**3. ශ්‍රී ලංකාවේ බහුවිධ සමාජ ආකෘති :**

- වාර්ගික සමූහ සහ ඒවායේ ලක්ෂණ හඳුනා ගැනීම.
- වාර්ගිකත්වය හා වාර්ගික අනන්‍යතාව හඳුනා ගැනීම.
- ජනවර්ගය, සමාජ විවිධත්වය සහ බහුත්වවාදය.
- ශ්‍රී ලංකාවේ වාර්ගික ගැටලුව සහ එහි කාලීන ප්‍රවණතා.

**4. ජනගහනය:**

- ජනගහනය හඳුනා ගැනීම; ජනගහනය සම්බන්ධ සංකල්ප හා සිද්ධාන්ත.
- ප්‍රජාවිද්‍යාත්මක දර්ශක හා ප්‍රවණතා.
- ජනගහන සංක්‍රමණ සහ ජන සංක්‍රමණ රටා.
- ශ්‍රී ලංකාවේ ජනගහනය සහ ජන විකාශන සංක්‍රාන්තිය.
- ලෝක ජනගහනය හා එහි ප්‍රවණතා.

**5. සමාජ සුභසාධනය :**

- සමාජ සුභසාධනය හා සමාජ ආරක්ෂණය සංකල්පමය හා න්‍යායාත්මකව අවබෝධ කර ගැනීම.
- ශ්‍රී ලංකාවේ සමාජ සුභසාධන වැඩසටහන් හා ව්‍යාපාරවල ආරම්භය සහ විකාශය.
- සමාජ ආරක්ෂණය හා එහි කාලීන ප්‍රවණතා සංවර්ධනය කෙරෙහි ඇති කරන බලපෑම.

**6. ලිංගිකත්වය සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය :**

- ලිංගිකත්වය නිර්වචනය කිරීම.
- සමාජ සංස්කෘතික සංදර්භය තුළ ලිංගිකත්වය පිළිබඳ අදහස.
- ජීවවිද්‍යාත්මක නියතිවාදය සහ ලිංගිකත්ව කාර්ය න්‍යාය, පුරුෂායිතය සහ ස්ත්‍රීත්වය.
- ස්ත්‍රී පුරුෂ සමාජභාවය සහ අසමානතාව.
- ස්ත්‍රී පුරුෂ සමාජභාවී සංවේදීතාව සහ ස්ත්‍රී පුරුෂ භාවය මත වෙන්කොට සැලකීම.

**7. සමාජ ප්‍රශ්න: ඒවායේ බලපෑම් සහ විසඳීමේ ප්‍රවේශ .**

- දුගීභාවය
- සියදිවි නසා ගැනීම
- ගණිකා වෘත්තිය
- ළමා අපයෝජන
- අපරාධ සහ අපගාමීත්වය
- මත්ද්‍රව්‍ය ඇබ්බැහිය
- දික්කසාදය.

**ඉගෙනුම්/ඉගැන්වීම් ක්‍රමවේදය :-**

දේශන, මාර්ගගත දේශන, එල්.එම්.එස්. (LMS), සාකච්ඡා, ඉදිරිපත් කිරීම්, නිබන්ධන සහ පැවරුම් යනාදී විෂය ඉගැන්වීම් ක්‍රමවේද ප්‍රයෝජනයට ගනියි.

**ඇගයීමේ ක්‍රමය :-**

අධ්‍යයන වර්ෂය අවසානයේ ලිඛිත පරීක්ෂණය සඳහා ලකුණු 100% හෝ අධ්‍යයන වර්ෂය අවසානයේ දී ලිඛිත පරීක්ෂණය සඳහා ලකුණු 80% ක් සහ පැවැරුම් සඳහා ලකුණු 20% ක් හිමි වේ.

**නිර්දේශිත කියවීම් :-**

1. අමරතුංග, පී. (2012). ප්‍රායෝගික සමාජවිද්‍යාව. කඩවතඃ කර්තෘ ප්‍රකාශන.
2. කරුණාතිලක, කේ. (2013). ප්‍රායෝගික සමාජවිද්‍යාව. කඩවත: මාලිංග ප්‍රකාශකයෝ.
3. කරුණාතිලක, කේ. (1998). අපරාධ, බාලාපරාධ සහ පුනරුත්ථාපනය. කඩවතඃ මාලිංග ප්‍රකාශකයෝ.
4. කරුණාතිලක, කේ. (2003). දික්කසාදය සමාජ ගැටලුවක් ලෙස, ප්‍රවාද. වෙළුම කොළඹ, ශ්‍රී ලංකා සමාජීය විද්‍යාඥයින්ගේ සංගමය.

5. ද සිල්වා, ඉන්ද්‍රලාල්. (2010). ශ්‍රී ලංකාවේ ජනගහනය: ඉහළ යන සාඵල්‍යතාව සහ ඉදිරි සංවර්ධන අභියෝග. කර්තෘ ප්‍රකාශන.
6. සුබසිංහ, ඩබ්. (2017). ප්‍රායෝගික සමාජවිද්‍යාව. කඩවත: කර්තෘ ප්‍රකාශන.
7. සුබසිංහ, ඩබ්. (2016). සමාජ වෙනස්වීම. කඩවත: කර්තෘ ප්‍රකාශන.
8. ජයවීර, එස්. (2015). අපගාමී චර්යා. කඩවත: නුවණී ප්‍රකාශන.
9. Andersen, Margaret L. (2006). Thinking About Women: Sociological Perspectives on Sex and Gender. (7th Ed.). Boston: Allyn & Bacon.
10. Bandarage, Ashoka. (2009). The Separatist Conflict in Sri Lanka: Terrorism, ethnicity and political economy, Colombo; Vijitha Yapa Publication
11. Dube, S. C: (1998). Modernization and Development. Tokyo: The United Nation University.
12. Indralal Silva, Karunathilake, K, Roy Perera. (2009). 'Patterns of Sexual Vulnerability among Adolescents and Youths in Sri Lanka', In Asian Population Studies. Vol. 5, Issue 1, Routledge Publication.
13. Indralal Silva, Karunathilake, K. (2011). 'Emerging Sexual Vulnerability Among Adolescents and Youth in Sri Lanka' in Population, Gender and Reproductive Health, Editors: F. Ram, Sayeed Unisa and T.V. Sekher, Mumbai. International Institute for Population Sciences.
14. Sanday, Preggy Reeves, (1987). Female Power and Male Dominance: on the Origin of Sexual Inequality. Cambridge: Cambridge University Press.

# දෙවන වසර

# SOCI 28214
# SOCI 28224

**පාඨමාලා කේතය** :- **SOCI 28214**

**වර්ගය** :- හර

**මාතෘකාව** :- සමාජවිද්‍යාත්මක න්‍යාය

**ඉගෙනුම් පල** :-

මෙම විෂය ඒකකය හැදෑරීම තුළින් ශිෂ්‍යයන් තුළ සමාජවිද්‍යාව විෂයේ ප්‍රධාන අංගයක් ලෙස න්‍යායේ වැදගත්කම හඳුනා ගැනීම, සමාජවිද්‍යාවේ සම්භාව්‍ය න්‍යාය හා නූතන න්‍යාය වෙන් කොට හඳුනා ගැනීම, විවිධ න්‍යායන් හා ඒවායින් සමාජ ප්‍රපංච විවරණය කෙරෙන පරිමාව හඳුනා ගැනීම, සමාජවිද්‍යාවේ න්‍යායාත්මක පර්යාලෝකවල වැදගත්කම තේරුම් ගැනීම සහ සමාජවිද්‍යාවේ සූක්ෂ්ම හා සාර්ව න්‍යායන් හඳුන්වාදුන් න්‍යායාචාර්යවරු පිළිබඳ අවබෝධය පුළුල් කිරීමට අපේක්ෂිත ය.

**පාඨමාලා අන්තර්ගතය** :-

**සමාජවිද්‍යාත්මක න්‍යාය හඳුනා ගැනීම:**

- න්‍යාය යනු කුමක් ද? න්‍යායේ මූලික ලක්ෂණ, විවිධ වර්ග හා න්‍යායේ කාර්යභාරය.
- සමාජවිද්‍යාත්මක න්‍යායේ විකාශය; මූලාරම්භක අවධිය, සම්භාව්‍ය අවධිය හා නූතන අවධිය.

**සමාජවිද්‍යාත්මක චින්තනයේ මූලාරම්භක අවධිය:**

- ඔගස්ට් කොම්ට්ගේ සමාජවිද්‍යාත්මක චින්තනය; සමාජ ස්තිථිකය හා සමාජගතිකය, යථානුභූතවාදය හා සමාජ පරිණාමවාදී න්‍යාය.
- හර්බට් ස්පෙන්සර්; සමාජය පිළිබඳ ඓන්ද්‍රිය සාදෘශ්‍ය සංකල්පය හා සමාජ පරිණාමවාදී න්‍යාය.

**සම්භාව්‍ය සමාජවිද්‍යාත්මක චින්තනය:**

- එමිල් ඩුර්කයිම්; සමාජ කරුණු, සමාජ පරිණාමවාදය, සියදිවි නසා ගැනීම සහ ආගම පිළිබඳ න්‍යායාත්මක විග්‍රහය.
- කාල් මාක්ස්; ද්වන්දාත්මක භෞතිකවාදය, ඓතිහාසික භෞතිකවාදය, ආර්ථික නියතිවාදය, සමාජ පංති න්‍යාය සහ ආගම හා පරාරෝපණය පිළිබඳ න්‍යාය.
- මැක්ස් වෙබර්; සමාජ ක්‍රියා න්‍යාය, සමාජ ස්තරායනය පිළිබඳ බහු විචල්‍ය විග්‍රහය, සමාජයේ බලය හා ආධිපත්‍ය පිළිබඳ විග්‍රහය, ආගම හා යුරෝපීය ධනේශ්වරයේ නැගීම.
- නූතන සමාජවිද්‍යාත්මක න්‍යායයන්:
- කෘත්‍යවාදය: බී. මැලිනොවුස්කි, ඒ. ආර්. රැඩික්ලිෆ් බ්‍රවුන්, එමිල් ඩුර්කයිම්, ටැල්කොට් පාසන්ස්, රොබට් කේ. මර්ටන්, මේරියන් ලෙවී සහ කිංග්ස්ලි ඩේවිස්.
- ගට්ටනවාදය: කාල් මාක්ස්, රැල්ෆ් ඩැරෙන්ඩෝෆ්, ලෙවිස් කෝසර් සහ හබර්මාස්.
- සංකේතාත්මක අන්තර්ක්‍රියාවාදය: සී. එච්. කූලී, ජෝර්ජ් හර්බට් මීඩ් සහ අර්වින් ගොෆ්මාන්.

**ඉගෙනුම්/ඉගැන්වීම් ක්‍රමවේදය :-**

දේශන, මාර්ගගත දේශන, එල්.එම්.එස්. (LMS), සාකච්ඡා, ඉදිරිපත් කිරීම්, නිබන්ධන සහ පැවරුම් යනාදී විෂය ඉගැන්වීම් ක්‍රමවේද ප්‍රයෝජනයට ගනියි.

**ඇගයීමේ ක්‍රමය :-**

අධ්‍යයන වර්ෂය අවසානයේ ලිඛිත පරීක්ෂණය සඳහා ලකුණු 100% හෝ අධ්‍යයන වර්ෂය අවසානයේ දී ලිඛිත පරීක්ෂණය සඳහා ලකුණු 80% ක් සහ පැවැරුම් සඳහා ලකුණු 20% ක් හිමි වේ.

**නිර්දේශිත කියවීම් :-**


1. කරුණාතිලක, කේ. (2010). සමාජවිද්‍යා න්‍යාය. කඩවත: මාලිංග ප්‍රකාශකයෝ.
2. දිසානායක, යූ. (2019). සම්භාව්‍ය සමාජ විද්‍යාත්මක න්‍යාය. හෙයියන්තුඩුව: ස්ට්‍රීම් ඇඩ්ස් ප්‍රකාශකයෝ.
3. ජයසිංහ, ඒ. කේ. පී. (2013). සමාජවිද්‍යා න්‍යාය. කඩවත: කඩුල්ල ප්‍රකාශකයෝ.
4. පෙරේරා, ජේ. (2011). සම්භාව්‍ය සමාජ විද්‍යාඥයෝ. කඩවත: මාලිංග ප්‍රකාශකයෝ.
5. සුබසිංහ, ඩබ්. (2021). සමාජවිද්‍යා න්‍යාය, 1 කොටස. ගම්පහ: Nine Publishing.
6. Abraham, M. F. (2006). Modern Sociological Theory. New Delhi: Oxford University press.
7. Giddens, A. (2011). Sociology. London: Polity Press.
8. Ritzer, George, (2000). Classical Sociological Theory. Boston: Mcgraw Hill Higher Education.

**පාඨමාලා කේතය** :- **SOCI 28224**

**වර්ගය** :- හර

**මාතෘකාව** :- **සංස්කෘතිය සහ සංවර්ධනය**

**ඉගෙනුම් පල** :-

මෙම විෂය ඒකකය හැදෑරීමෙන් විද්‍යාර්ථීන් තුළ සමාජ විද්‍යාත්මක හා මානවවිද්‍යාත්මක දෘෂ්ටිකෝණයකින් සංස්කෘතිය යනු කුමක්දැයි අවබෝධ කර ගැනීම, සමාජ වෙනස්වීම, සංවර්ධනය හා සැලසුම්ගත වෙනස්වීම අතර ඇති වෙනස හඳුනාගැනීම, සංවර්ධනය හා ඌන සංවර්ධනය පිළිබඳ විවිධ න්‍යායන් විග්‍රහකර බැලීම හා ශ්‍රී ලංකා සමාජ සංස්කෘතිය සමග ඒවා සැසඳීම, සංස්කෘතිය හා සංවර්ධනය සම්බන්ධ අවහිරතා සහ ගැටලු විග්‍රහ කොට තේරුම් ගැනීම, සංවර්ධනය හා පරිසරය අතර ඇති බැඳීම නිදර්ශනාත්මක ව අර්ථකථනය කර ගැනීමේ හැකියාව වර්ධනය කිරීමට අපේක්ෂිත ය.

**පාඨමාලා අන්තර්ගතය** :-

01. **සංස්කෘතිය:**

- සංස්කෘතිය නිර්වචනය කිරීම, එහි මූලික ලක්ෂණ හා කාර්යභාරය තේරුම් ගැනීම.
- සංස්කෘතියේ විවිධ ප්‍රභේද; භෞතික සංස්කෘතිය හා අභෞතික සංස්කෘතිය.
- සංස්කෘතිය සහ සංවර්ධනය: සංස්කෘතික විසරණය, සංස්කෘතික කම්පනය, සංස්කෘතික ලැග්ම, උපසංස්කෘතිය සහ මානව කේන්ද්‍රනවාදය.

**2. සංවර්ධනය:**

- සංවර්ධනය පිළිබඳ බහුමානී නිර්වචන.
- සංවර්ධනය පිළිබඳ න්‍යායාත්මක අර්ථ නිරූපණය.
- සංවර්ධනය පිළිබඳ මිනුම්.
- තිරසර සංවර්ධන ඉලක්ක.
- ඌන සංවර්ධනය: ඌන සංවර්ධනයේ මූලික ලක්ෂණ, ඌන සංවර්ධනය පිළිබඳ න්‍යායන්

**3. සංවර්ධනය හා සංවර්ධන සැලසුම්කරණය:**

- සැලසුම්කරණයේ මූලිකාංග හඳුනාගැනීම.
- සංවර්ධන සැලසුම් වර්ග.
- ප්‍රජා සංවර්ධනය.

**4. සංවර්ධනය හා සංස්කෘතික වර්ධනය අතර ඇති සම්බන්ධතාව:**

- සංවර්ධනයට එරෙහි සංස්කෘතික බාධා.
- සංවර්ධනය සඳහා අවශ්‍ය සංස්කෘතික පෙළඹවීම්, ආකල්ප හා අගනාකම්.

**5.කාන්තාව සහ සංවර්ධනය:**

- ස්ත්‍රීවාදය හා ස්ත්‍රීවාදී ව්‍යාපාර හඳුනාගැනීම.
- ශ්‍රී ලංකාවට විශේෂිතව කාන්තාවන්ගේ සමාජ තත්ත්වයන් හා කාර්ය කොටස් වෙනස්වීම.
- කාන්තා සවිබලගැන්වීම.

**6.සංස්කෘතික වෙනස්වීම හා සමාජ ප්‍රශ්න:**

- තරුණ අසහනය, දේශපාලන ප්‍රචණ්ඩත්වය සහ කැරලි
- ලිංගික ප්‍රශ්න, ලිංගික ප්‍රචණ්ඩත්වය සහ ලිංගික සම්ප්‍රේෂණ රෝග.
- සමාජ මාධ්‍ය, ප්‍රලාප සහ ජනප්‍රිය නැඹුරුව.

**7. පරිසරය සහ සංවර්ධනය :**

- මිනිසා සහ පරිසරය අතර ඇති සම්බන්ධතාව අර්ථකථනය කිරීම.
- පරිසර හායනය, වනාන්තර සහ වන ආවරණ හායනය.
- ස්වභාවික විපත්, පරිසර දූෂණය සහ පාරිසරික ගැටලු.
- පරිසර සංරක්ෂණ උපායමාර්ග සහ ඉඩම් පරිහරණ සැලසුම් හඳුනාගැනීම.

**ඉගෙනුම්/ඉගැන්වීම් ක්‍රමවේදය :-**

දේශන, මාර්ගගත දේශන, එල්.එම්.එස්. (LMS), සාකච්ඡා, ඉදිරිපත් කිරීම්, නිබන්ධන සහ පැවරුම් යනාදී විෂය ඉගැන්වීම් ක්‍රමවේද ප්‍රයෝජනයට ගනියි.

**ඇගයීමේ ක්‍රමය :-**

අධ්‍යයන වර්ෂය අවසානයේ ලිඛිත පරීක්ෂණය සඳහා ලකුණු 100% හෝ අධ්‍යයන වර්ෂය අවසානයේ දී ලිඛිත පරීක්ෂණය සඳහා ලකුණු 80% ක් සහ පැවැරුම් සඳහා ලකුණු 20% ක් හිමි වේ.

**නිර්දේශිත කියවීම් :-**


1. හාසින්, කේ. (1994). පිතෘ මූලිකත්වය යනු කුමක් ද?. කොළඹ: සමාජ විද්‍යාඥයින්ගේ සංගමය.
2. කරුණාතිලක, කේ. (2013). ප්‍රායෝගික සමාජවිද්‍යාව, කඩවත: මාලිංග ප්‍රකාශකයෝ.
3. දිසානායක යූ. (2010). අභිචාරඃඅභිචාර සහ ශ්‍රී ලංකාවේ අභිචාර පිළිබඳ මානව විද්‍යාත්මක විමසුමක්. වාරියපොළඃ ආරිය ප්‍රකාශකයෝ.
4. විතාරණ, එස්. සහ රණසිංහ, සී. (2018). ගණනාතගේ රචනා. කැලණිය විශ්වවිද්‍යාලයඃ සමාජීය විද්‍යා පීඨ පර්යේෂණ මධ්‍යස්ථානය.
5. රාජරත්න, එම්. (2012). ශ්‍රී ලංකාව: ආසියාවේ අභිමි ආශ්චර්ය. මහරගම: රාවය ප්‍රකාශන.
6. සුබසිංහ, ඩබ්. (2019). සංස්කෘතිය සහ සංවර්ධනය. කඩවතඃ කර්තෘ ප්‍රකාශන.
7. Bartelmus, P. (1994). Environment Growth and Development; The Concepts and Strategies of sustainability. London: Routledge
8. Chaudhuri, Maitrayee. (2003). The Practice of Sociology, New Delhi: Orient Longman.
9. Chambers, Robert. (1980). Rural Development: Putting the Last First. London: Longman.
10. Dube, S. C. (1990). Tradition and Development. New Delhi: Vikas publishing House Pvt Ltd.

11. Escobar, A. (1995). Encountering Development: The Making and Unmaking of the Third World. Princeton: Princeton University Press.
12. Escobar, A. (1992). Culture, Practice and Politics: Anthropology and the Study of Social Movements, Critique of Anthropology. Vol.12 No.4.Indralal Silva, Karunathilake, K, Roy Perera. (2009). 'Patterns of Sexual Vulnerability among Adolescents and Youths in Sri Lanka', In Asian Population Studies. Vol. 5, Issue 1, Routledge Publication.
13. Indralal Silva, Karunathilake, K. (2011). 'Emerging Sexual Vulnerability Among Adolescents and Youth in Sri Lanka' in Population, Gender and Reproductive Health, Editors: F. Ram, Sayeed Unisa and T.V. Sekher, Mumbai. International Institute for Population Sciences.
14. Sanday, Preggy Reeves, (1987). Female Power and Male Dominance: on the Origin of Sexual Inequality. Cambridge: Cambridge University Press.

# තෙවන වසර

# SOCI 38214
# SOCI 38224

**පාඨමාලා කේතය** :- **SOCI 38214**

**වර්ගය** :- හර

**මාතෘකාව** :- දකුණු ආසියාතික සමාජය

**ඉගෙනුම් පල** :-

මෙම විෂය ඒකකය හැදෑරීම තුළින් විද්‍යාර්ථීන්ට දකුණු ආසියාතික සමාජය හා ඊට ආවේණික ලක්ෂණ පිළිබඳ සමාජවිද්‍යාත්මක හා මානවවිද්‍යාත්මක දෘෂ්ටිකෝණයකින් අවබෝධ කර ගැනීම, දකුණු ආසියාතික සමාජය, සංස්කෘතිය හා එහි අනන්‍යතාවයේ ඇති වැදගත්කම හඳුනාගැනීම, සම්භාව්‍ය හා නූතන සමාජවිද්‍යාඥයන් විසින් සංවර්ධනය කළ මූලික සමාජවිද්‍යාත්මක න්‍යායන් ඔස්සේ ග්‍රාමීය හා නාගරික සමාජ සන්දර්භයන් අතර ඇති වෙනස තේරුම් ගැනීම, සමාජවිද්‍යාත්මක හා මානවවිද්‍යාත්මක සංකල්ප, න්‍යායන් භාවිතයෙන් දකුණු ආසියාතික සමාජයට අයත් සාම්ප්‍රදායික හා නූතන සමාජ සම්බන්ධතා වෙන්කොට හඳුනාගැනීම, ශ්‍රී ලංකාවට විශේෂිත වූ සමාජ වෙනස්වීමේ හා සංස්කෘතික ක්‍රියාකාරකම්වල පරිවර්තනයක් තුළින් සංවර්ධන උපායමාර්ගික මොඩලයක් සංවර්ධනය කිරීමට හැකියාව ලැබෙනු ඇත.

**පාඨමාලා අන්තර්ගතය** :-

**01. දකුණු ආසියාතික සමාජයේ භූගෝලීය හා සමාජ සංස්කෘතික පසුබිම:**

- දකුණු ආසියාවේ භූ දේශපාලනය සහ පරිසර විද්‍යාත්මක වැදගත්කම.

- දකුණු ආසියාතික සමාජයේ සමාජ සංස්කෘතික අනන්‍යතාව පිළිබිඹු කරන සාධක: වාර්ගිකත්වය, ආගම, සමාජ ස්තරායනය, පවුල, විවාහය සහ ඥාතිත්වය, ආහාර සංස්කෘතිය, දේශපාලනය, අර්ථක්‍රමය හා සාමූහිකත්වය.

**2. ග්‍රාමීය දකුණු ආසියාව :**

- සමාජවිද්‍යාත්මක හා මානවවිද්‍යාත්මක අධ්‍යයන ඔස්සේ ගැමි සමාජ හඳුනාගැනීම.
- ගැමි සමාජයේ මූලික ලක්ෂණ.
- ශ්‍රී ලංකාවේ සාම්ප්‍රදායික ගැමි සමාජය: සාම්ප්‍රදායික සිංහල ගමක සමාජ ව්‍යූහය සහ සංවිධානය.

**3. දකුණු ආසියාවේ කුලක්‍රමය :**

- හින්දු කුලක්‍රමය.
- සිංහල කුලක්‍රමය.

**4. නාගරික දකුණු ආසියාව :**

- නාගරීකරණය යනු කුමක් ද? නාගරීකරණය පිළිබඳ න්‍යායාත්මක පර්යාලෝකය.
- නාගරික ජීවනක්‍රමය පිළිබඳ සමාජවිද්‍යාත්මක අර්ථ විවරණය.
- නාගරික සමාජ ලක්ෂණ.
- දකුණු ආසියාතික නාගරීකරණයේ ප්‍රවණතා.

**5. දකුණු ආසියාවේ ආගම් :**

- ආගම හා අභිචාර පිළිබඳ සමාජවිද්‍යාත්මක හා මානවවිද්‍යාත්මක චින්තනය.

- දකුණු ආසියාවේ ආගම් : බුදුදහම, හින්දු ආගම, ඉස්ලාම් ආගම, හා කලාපයේ වෙනත් ආගමික ඇදහිලි.
- ශ්‍රී ලංකාවේ ආගමික සමාජ ව්‍යාපාර හා ඒවායේ සමාජ සංස්කෘතික බලපෑම.

**6. පවුල විවාහය සහ ඥාතිත්වය :**

- පවුල විවාහය සහ ඥාතිත්වය සමාජ ව්‍යූහය සහ සංවිධානයට වැදගත්වන ආකාරය සමාජවිද්‍යාත්මකව හඳුනාගැනීම.
- ශ්‍රී ලංකාවේ පවුල් ක්‍රමය, විවාහය හා ඥාතික්‍රමය වෙනස්වීමට බඳුන් වී ඇති ආකාරය හඳුනාගැනීම.

**7. ශ්‍රී ලංකාවේ සංවර්ධන උපායමාර්ග:**

- නව සංවර්ධන උපායමාර්ගවල ස්වභාවය හා ප්‍රතිඵල: ගොවිජනපද ව්‍යාපාර, හරිත විප්ලවයේ බලපෑම, මහවැලි සංවර්ධන ව්‍යාපාරය, සංචාරක ව්‍යාපාරය, නිදහස් වෙළඳ කලාප ක්‍රමය හා වරාය නගර සංවර්ධන ව්‍යාපෘතිය යනාදිය.
- නව සංවර්ධන උපායමාර්ගවල ලක්ෂණ සමාජ සංවර්ධනය මත ඇති කරන බලපෑම හඳුනාගැනීම.

**8. දකුණු ආසියාවේ ප්‍රාථමික සමාජ :**

- දකුණු ආසියාතික ප්‍රාථමික ජනයාගේ වාර්ගිකත්ව සහ සමාජ මානවවිද්‍යාත්මක ලක්ෂණ .
- දකුණු ආසියාවේ ප්‍රාථමික ජනයා පිළිබඳ ජාතික ප්‍රතිපත්ති සහ ක්‍රියාමාර්ග.
- දකුණු ආසියාතික ප්‍රාථමික සමාජ පිළිබඳ සම්භාව්‍ය මානවවිද්‍යාත්මක හා සමාජවිද්‍යාත්මක අධ්‍යයන.

**ඉගෙනුම්/ඉගැන්වීම් ක්‍රමවේදය :-**

දේශන, මාර්ගගත දේශන, එල්.එම්.එස්. (LMS), සාකච්ඡා, ඉදිරිපත් කිරීම්, නිබන්ධන සහ පැවරුම් යනාදී විෂය ඉගැන්වීම් ක්‍රමවේද ප්‍රයෝජනයට ගනියි.

**ඇගයීමේ ක්‍රමය :-**

අධ්‍යයන වර්ෂය අවසානයේ ලිඛිත පරීක්ෂණය සඳහා ලකුණු 100% හෝ අධ්‍යයන වර්ෂය අවසානයේ දී ලිඛිත පරීක්ෂණය සඳහා ලකුණු 80% ක් සහ පැවැරුම් සඳහා ලකුණු 20% ක් හිමි වේ.

**නිර්දේශිත කියවීම් :-**


- විතාරණ, එස්. (2014). දකුණු ආසියාතික සමාජය සහ සංස්කෘතිය. රනාලඃ දකුණු ආසියානු පර්යේෂණ කේන්ද්‍රය.
- රණසිංහ, සී. (පරි). (2009). වැද්දෝ. කොළඹඃ ෆාස්ට් පබ්ලිෂින්.
- සුබසිංහ, ඩබ්. (2018). දකුණු ආසියාතික සමාජය. කඩවතඃ කර්තෘ ප්‍රකාශන.
- Redfield, R. (1989). The Little Community and Peasant Society and Culture. London: The University of Chicago Press.
- Ryan, Bryce, (1953). Caste in Modern Ceylon. U.S.A.: Rutgers University Press.
- Yalman, Nur, (1967), Under the Bo Tree: Studies in Caste, Kinship and Marriage in the Interior of Ceylon. Berkeley: University of California Press.
- Kumar, A. (edit). (1999). Rural Sociology. Delhi: Anmol Publications Pvt. Ltd.
- Obeyesekere, Gananath. (1967). Land Tenure in Village Ceylon. London: Cambridge University Press.
- Tambiah, Stanley. J. (1992). Buddhism Betrayed? Religion, Politics and Violence in Sri Lanka. Chicago: The University of Chicago Press.

**පාඨමාලා කේතය** :- **SOCI 38224**

**වර්ගය** :- හර

**මාතෘකාව** :- සමාජ පර්යේෂණ ක්‍රම

**ඉගෙනුම් පල** :-

මෙම විෂය ඒකකය හැදෑරීම තුළින් විද්‍යාර්ථීන්ට සමාජ පර්යේෂණවල අවශ්‍යතාව, එහි මූලික පියවර සහ සමාජ පර්යේෂණ ක්‍රියාවලිය පිළිබඳ නිවැරදි අවබෝධයක් ලබා ගැනීම, සමාජ පර්යේෂණවල ඥානමීමංසාත්මක ප්‍රවේශ හා විද්‍යාත්මක ස්වභාවය අවබෝධ කර ගැනීම, සමාජ පර්යේෂණ සැලසුම් පිළියෙල කිරීම පිළිබඳ කුසලතාව ලබා ගැනීම, පර්යේෂණ විධික්‍රම හා දත්ත රැස් කිරීමේ ශිල්පක්‍රම තෝරා බේරාගෙන භාවිත කිරීමේ හැකියාව දියුණු කර ගැනීම, තෝරාගත් පර්යේෂණ ව්‍යාපෘතියක් භාවිතයෙන් දත්ත විශ්ලේෂණය, අර්ථ නිරූපණය, සහ කුඩා පරිමාවේ පර්යේෂණ වාර්තාවක් සකස් කිරීමට පුහුණුවක් ලබා ගැනීමට හැකිවනු ඇත.

**පාඨමාලා අන්තර්ගතය** :-

**1. සමාජ පර්යේෂණ පිළිබඳ හැඳින්වීම :**

- සමාජ පර්යේෂණ යනු මොනවා දැ යි නිර්වචනය කිරීම සහ පර්යේෂණවල මූලික ලක්ෂණ හඳුනාගැනීම.
- සමාජ පර්යේෂණවල දාර්ශනික හා විද්‍යාත්මක පදනම හඳුනා ගැනීම.
- සමාජීය විද්‍යා පර්යේෂණ භාවිතයේ ඓතිහාසික පසුබිම හා සංවර්ධනය.

**2. පර්යේෂණවල දාර්ශනික පසුබිම :**

- සත්භාවවේදය සහ ඥානමීමංසාව.
- සමාජ ඥානමීමංසාව.

**3. සමාජ පර්යේෂණවල විවිධ ප්‍රභේද:**

- සමාජ පර්යේෂණ පිළිබඳ වර්ගීකරණ.
- ප්‍රාථමික වර්ගීකරණ; ඓතිහාසික සමාජ පර්යේෂණ, විවරණාත්මක පර්යේෂණ සහ අත්හදා බැලීමේ සමාජ පර්යේෂණ.
- උසස් වර්ගීකරණ; මූලික පර්යේෂණ හා ව්‍යවහාරික පර්යේෂණ, උපන්‍යාස පර්යේෂණ හා ගවේෂණාත්මක පර්යේෂණ, ප්‍රමාණාත්මක සමාජ පර්යේෂණ හා ගුණාත්මක සමාජ පර්යේෂණ.

**4. සමාජ පර්යේෂණ ක්‍රියාවලිය හා පර්යේෂණ සැලැස්ම :**

- පර්යේෂණ ක්‍රියාවලියේ ප්‍රධාන අදියර .
- පර්යේෂණ සැලැස්මක මූලික පියවර.
- සමාජ පර්යේෂණ සැලැස්මක් සකස් කිරීම.

**5. පර්යේෂණ විධික්‍රම සහ දත්ත රැස් කිරීමේ ශිල්පක්‍රම :**

- පර්යේෂණ විධික්‍රම තෝරා ගැනීමේ දී සැලකිල්ලට ගත යුතු කරුණු.
- ප්‍රධාන සමාජ පර්යේෂණ විධික්‍රම: තුලනාත්මක ක්‍රමය, සමීක්ෂණ ක්‍රමය, ඓතිහාසික ක්‍රමය, ජීවන ඓතිහාසික ක්‍රමය, සංඛ්‍යානමය ක්‍රමය සහ මානවවංශලේඛන ක්‍රමය, යනාදිය .
- මූලාශ්‍රය සහ දත්ත; ප්‍රාථමික හා ද්විතීයික දත්ත, ප්‍රමාණාත්මක හා ගුණාත්මක දත්ත
- දත්ත රැස් කිරීමේ ශිල්ප ක්‍රම: ප්‍රශ්නාවලී ක්‍රමය, සම්මුඛ සාකච්ඡා ක්‍රමය සහ නිරීක්ෂණ ක්‍රමය.

**6. සමාජ පර්යේෂණ සහ නියැදි භාවිතය :**

- නියැදිකරණය පිළිබඳ සංකල්ප හා මූලධර්ම හඳුනාගැනීම.
- නියැදි තේරීමේ ප්‍රධාන මූලධර්ම: සසම්භාවී නියැදි තේරීම හා අසම්භාවී නියැදි තේරීම.
- ප්‍රමාණාත්මක හා ගුණාත්මක සමාජ පර්යේෂණ සඳහා භාවිත කරන විවිධ නියැදි වර්ග.

**7. පර්යේෂණයක අවසන් වාර්තාව ලිවීම:**

- ශාස්ත්‍රීය ලේඛන ශෛලිය.
- අවසන් පර්යේෂණ වාර්තාවේ මූලික පියවර
- මූලාශ්‍රය විමර්ශන සටහන් කිරීමේ ක්‍රම.
- ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය සකස් කිරීමේ විවිධ ක්‍රම .

**8. පර්යේෂණ ආචාරධර්ම :**

- පර්යේෂණ ආචාරධර්මවල මූලාරම්භය.
- සමාජ පර්යේෂණවලට අදාළ පර්යේෂණ ආචාරධර්ම.

**ඉගෙනුම්/ඉගැන්වීම් ක්‍රමවේදය :-**

දේශන, මාර්ගගත දේශන, එල්.එම්.එස්. (LMS), සාකච්ඡා, ඉදිරිපත් කිරීම්, නිබන්ධන සහ පැවරුම් යනාදී විෂය ඉගැන්වීම් ක්‍රමවේද ප්‍රයෝජනයට ගනියි.

**ඇගයීමේ ක්‍රමය :-**

අධ්‍යයන වර්ෂය අවසානයේ ලිඛිත පරීක්ෂණය සඳහා ලකුණු 100% හෝ අධ්‍යයන වර්ෂය අවසානයේ දී ලිඛිත පරීක්ෂණය සඳහා ලකුණු 80% ක් සහ පැවැරුම් සඳහා ලකුණු 20% ක් හිමි වේ.

**නිර්දේශිත කියවීම් :-**


1. උයන්ගොඩ, ජේ. 2011). සමාජීය විද්‍යා පර්යේෂණ යෝජනාවලියක් ලිවීම. කොළඹ: සමාජ විද්‍යාඥයන්ගේ සංගමය.
2. උයන්ගොඩ, ජේ. (2010). සාමාජීය-මානවීය විද්‍යා පර්යේෂණ. කොළඹ: සමාජ විද්‍යාඥයන්ගේ සංගමය.
3. දිසානායක, යූ. (2016). සමාජ පර්යේෂණ මූලධර්ම. හෙයියන්තුඩුව: ස්ට්‍රීම් ලයින් ඇඩ්ස් ඇන්ඩ් පබ්ලිෂර්ස්.
4. ජයතිස්ස, ඩබ්. ඒ. (1996). මූලික සංඛ්‍යාන විද්‍යාව. නුගේගොඩ: සරසවි ප්‍රකාශකයෝ.
5. සෝමසුන්දර, ඩී. (2015). ආදිවාසී පර්යේෂණ. කොළඹ: ගොඩගේ ප්‍රකාශන.
6. සුබසිංහ, ඩබ්. (2016). සමාජ පර්යේෂණ ක්‍රම. කඩවත: කර්තෘ ප්‍රකාශන.
7. Babbie, E. (2007). The Practice of Social Research. P.R. China: Wadsworth Publishing Company.
8. Sarantakos. S. (2012). Social Research. London: Palgrave Macmillan Publishers.
9. Silvamaan. D. (2004). Qualitative Research. New Delhi: SAGE.